# ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය

## උපකුලපති තනතුර සඳහා අයදුම්පත් / නාමයෝජනා කැඳවීම

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 34 වන වගන්තියේ සහ එහි තදනන්තර සංශෝධනවල ද 2020 මැයි මස 04 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අංක 02/2020 දරන චක්‍රලේඛයෙහි නියමයන් ප්‍රකාරව ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් 06.03.2022 වන දින සිට 06.04.2022 වෙනි දින තෙක් විශ්වවිද්‍යාලයේ උපකුලපති තනතුර සඳහා පුද්ගලයින්ගෙන් අයදුම්පත්/ නාමයෝජනා කැඳවනු ලැබේ.

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත අනුව උපකුලපති පූර්ණ කාලීන නිලධාරියෙක් වේ. ඔහු/ ඇය විශ්වවිද්‍යාලයේ ප්‍රධාන විධායක නිලධාරියා හා ගණන්දීමේ නිලධාරියා වේ. ඔහු/ ඇය නිල බලයෙන් පාලක සභාවේ හා සනාතන සභාවේ සාමාජිකයෙක් හා සභාපති ද වේ.

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ විධිවිධාන අනුව උපකුලපති ධූරයෙන් ඉවත් කරනු ලැබුවහොත් හෝ කලින් ධූරය අත්හැර ගියහොත් හෝ හැර වසර තුනක කාලයක් සඳහා පත් කරනු ලබන අතර, ඔහු/ඇය වයස අවුරුදු 65 සම්පූර්ණ වනතුරු හෝ උපකුලපති තනතුරේ කාලය අවසන් වනතුරු හෝ යන දෙකින් පූර්වයෙන් එළඹෙන දිනය තෙක් සේවය කළ යුතු වේ.

අධ්‍යයන කටයුතු මෙහෙයවීම, කළමනාකරණ ප්‍රතිපත්ති සකස් කිරීම, මෙහෙයවීම හා හඳුන්වාදීම, පාලක සභාවේ තීරණ ක්‍රියාත්මක කිරීම හා විශ්වවිද්‍යාලයේ සාමාන්‍ය පරිපාලනය සම්බන්ධයෙන් උපකුලපතිවරයා වගකිව යුතු බැවින් ඔහු / ඇය අධ්‍යයන විශිෂ්ටත්වය, පාරදෘශ්‍යභාවය, වගකීම, ප්‍රජාතාන්ත්‍රික කළමනාකරණය හා සඵල අපක්ෂපාති නායකත්ව මූලධර්ම උස්ථම්බනය කරනු ලැබිය යුතුය.

අපේක්ෂකයා ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු අතර, වයස අවුරුදු 63 ට අඩු විය යුතු ය. ප්‍රබල පර්යේෂණ පැතිකඩක්, ප්‍රත්‍යක්ෂ නායකත්ව ගුණාංග හා විවිධ අභිරුචි කණ්ඩායම් සමඟ වාස්තවිකව ගනුදෙනු කළ හැකි අන්තර් පෞද්ගලික නිපුණතා, ප්‍රතිපත්තිමය කරුණු සම්බන්ධයෙන් පැහැදිලි අවබෝධයක් හා තීරණ සඵල පරිදි ක්‍රියාත්මක කිරීමේ කැපවීම ඇතුළු උසස් ශාස්ත්‍රාලයීය ජයග්‍රහණ වාර්තාවක් සාර්ථක අපේක්ෂකයා සතුව තිබිය යුතු වේ. ප්‍රජාව කෙරෙහි ප්‍රයාපනය ඇතුළු විශ්වවිද්‍යාලයක ගුණාත්මකභාවය හා මෙහෙවර පිළිබඳව ගැඹුරු අවබෝධයක් ඔහු/ඇය වෙත තිබිය යුතුය.

උපකුලපති විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්යමණ්ඩල වැටුප් පරිමාණයේ ඉහළම වැටුප් තලයේ තැබීමට හිමිකම් ලබන අතර, අදාළ වැටුපෙන් 15% ක සංග්‍රහ දීමනාවක් සහ තනතුරට අදාළ අනෙකුත් දීමනා ලැබීමට හිමිකම් ලබයි.

අයදුම්පත්‍රය හෝ නාමයෝජනා පත්‍රය සමඟ පහත සඳහන් ලියකියවිලි ඉදිරිපත් කළ යුතු වේ.

1. විශ්වවිද්‍යාලයේ සංවර්ධනය පිළිබඳ දැක්ම ප්‍රකාශයක්, පත් කරනු ලැබුවහොත් අපේක්ෂකයා / නාමිකයා අත්කර ගැනීමට යෝජනා කරන දේ පිළිබඳ කෙටි විස්තරයක් සහ උපන්දිනය ඇතුළුව අයදුම්කරුගේ / නම් කරන ලද තැනැත්තාගේ සම්පූර්ණ ජීව දත්ත.
2. වත්මන් උපකුලපතිවරයා අයදුම්කරුවෙකු හෝ අයදුම්කරුවෙකු මීට පෙර විශ්වවිද්‍යාලයේ උපකුලපති ධූරය හෙබවූයේ නම්, ඔහු / ඇය ඉහත (1) ඡේදයේ සඳහන් ලියකියවිලිවලට අමතරව ඔහුගේ / ඇයගේ පූර්ව ධූර කාලය තුළ සිදුකරන ලද ජයග්‍රහණ ඉස්මතු කරන වාර්තාවක් ලබා දිය යුතුය.
3. නාමයෝජනා සම්බන්ධයෙන් නම් කරන ලද තැනැත්තාගේ කැමැත්ත සහිත ලිපියක්.
4. අයදුම්කරු/ නාමිකයා ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය හැර රාජ්‍ය සේවය, සමාගමක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ වෙනත් උසස් අධ්‍යාපන ආයතනයක සේවයෙහි නියුක්ත වන්නේ නම් අයදුම්කරු /නාමිකයා තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි බවට සේවායෝජකයාගෙන් ලිපියක්.

අයදුම්පත් / නාමයෝජනා, මුද්‍රා තැබූ කවරයක / ලියුම් කවරයක, **"ලේඛකාධිකාරී, පාලක සභාවේ ලේකම්, ලේඛකාධිකාරී කාර්යාලය, ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය, කුලියාපිටිය"** යන ලිපිනයට **2022 අප්‍රේල් මස 06 වන දින ප.ව. 3.00 ට** පෙර භාරදීමට හෝ ලියාපදිංචි කළ තැපෑලෙන් ලැබීමට හැකි වන පරිදි එවීමට හැකි ය. අයදුම්පත්/ නාමයෝජනා ඇතුළත් ලියුම් කවරයෙහි ඉහළ වම් කෙළවරේ **උපකුලපති තනතුර** ලෙස සඳහන් කළ යුතුය.

අයදුම්පත් / නාමයෝජනා අවසන් වූ දින සිට මාස දෙකක් ඇතුළත සම්මුඛ පරීක්ෂණ සඳහා ඇගයීම් කමිටු රැස්වීම කැඳවනු ලබන අතර, එය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ චක්‍රලේඛ අංක 02/2020 හි දක්වා ඇති ඇගයීම් සඳහා වන නිර්ණායකයන්ට අනුව පැවැත්වේ . මේ සඳහා පත් කරන ලද ඇගයීම් කමිටුවේ සම්මුඛ පරීක්ෂණයක් සඳහා අපේක්ෂකයින් කැඳවනු ලැබේ. මෙම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ වෙබ් අඩවි සබැඳියට පිවිසීමෙන් විස්තර ලබාගත හැකිය. https://www.ugc.ac.lk/en/policy/commission-circulars/176-circulars-published-in-2020-012020-and-above/2198-commission-circular-no-022020-appoinment-to-the-post-of-vice-chancellor.html සුවිශේෂී තත්වයක් තුළ කිසියම් අපේක්ෂකයෙකුට ඇගයීම් කමිටුව ඉදිරියේ පෙනී සිටීමට හැකියාවක් නොමැති නම් ඔහුට / ඇයට වීඩියෝ සම්මන්ත්‍රණයක් හරහා සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටීමට අවසර දිය හැකිය.

කොමිෂන් සභාව වෙත අපේක්ෂකයින් තිදෙනෙකුගේ නම් නිර්දේශ කිරීම සඳහා ඇගයීම් කමිටු රැස්වීම පැවැත්වෙන දිනයේම විශේෂ පාලක සභා රැස්වීමක් කැඳවනු ලැබේ.

ඇගයීම් කමිටුව විසින් කෙටි ලැයිස්තුගත කර පාලක සභාව විසින් අනුමත කරන ලද අපේක්ෂකයින් අවම වශයෙන් මිනිත්තු දහයක (10) නමුත් මිනිත්තු පහළොවක් (15) නොඉක්මවන කාල සීමාවක් තුළ කෙටි ඉදිරිපත් කිරීමක් සඳහා විශේව පාලක සභා රැස්වීමට පෙර කැඳවනු ලැබේ. කෙසේ වෙතත්, එවැනි අපේක්ෂකයින් සභාවේ සාමාජිකයෙකු වුව ද වෙනත් අපේක්ෂකයින් ඉදිරිපත් කිරීම සහ ඇගයීම සඳහා සහභාගී වීමට කිසිදු අපේක්ෂකයෙකුට ඉඩ නොදේ. සුවිශේෂී තත්වයක් තුළ, කිසියම් අපේක්ෂකයෙකුට විශේෂ පාලක සභා රැස්වීමට පෙනී සිටීමට හැකියාවක් නොමැති නම්, ඔහුට/ ඇයට වීඩියෝ සම්මන්ත්‍රණ මගින් ඉදිරිපත් කිරීමට අවසර දිය හැකිය.

අපේක්ෂකයින්ගේ නම් තුනක් නිර්දේශ කරමින් විශේෂ පාලක සභා රැස්වීමේ වාර්තාව සකස් කර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2020 හි දක්වා ඇති සියලුම ලියකියවිලි සමඟ වැඩිදුර කටයුතු සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසු ලැබෙන අයදුම්පත් / නාමයෝජනා සලකා නොබලන බව දන්වා සිටිමි.

**ලේඛකාධිකාරී / පාලක සභාවේ ලේකම්,**
**ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය,**
**කුලියාපිටිය.**

**2022.02.24**